# MEDIA TODAY

මාධ්‍ය ලෝකය ඔබ අතට

Volume 01 /6th Issue / 2014
ISSN 2279-3402
www.mediatoday.lk



## EXPLORE

වාචික මාධ්‍යයේ ප්‍රභවය හා විකාශය

## FEATURES

ගුවන්විදුලියට නව හැඳුනුම්පතක්

මහා සිනමාවේදී සත්‍යජිත් රායි

රාජ්‍ය මාධ්‍ය හා මාධ්‍ය රාජ්‍ය

## O/L සහ A/L

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය පාඩම් මාලාව මුල සිට

විශේෂ පුණරීක්ෂණ පාඩම් මාලාව

## COVER STORY

ජනහද, ජයදද නැංවූ ගිරුවාපත්තුවේ ශ්‍රී ලාංකේය අභිමානය

9 772279 340002
Rs. 200/=

පශ්චාත් නූතන සමාජයක සන්නිවේදන නියමුවා MEDIA TODAY

# ලිපි සරණිය

www.mediatoday.lk

MEDIA TODAY

6TH ISSUE 2014

07 කතුවැකිවලට ලේඛක නම යෙදිය යුතු ද?
කලාකීර්ති ආචාර්ය එඩ්වින් ආරියදාස

08 රාජ්‍ය මාධ්‍ය හා මාධ්‍ය රාජ්‍ය
ආචාර්ය ටියුඩර් වීරසිංහ

10 මහා සිනමාවේදී සත්‍යජිත් රායි
පී. එච්. චමින්ද

11 අපූර්ව සෞන්දර්යාත්මක අත්දැකීම 'රණවිරු රියල් ස්ටාර්'
ආචාර්ය ධර්මකීර්ති ශ්‍රී රන්ජන්

14 සංවිධානමය සන්නිවේදනය
මහාචාර්ය චන්ද්‍රසිරි රාජපක්ෂ

16 බෞද්ධ වන්දනා සංචාරක සංස්කෘතියේ අගය
ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර

18 ඇසිදිසි මනරම්
දිනේෂර පුංචිහේවා

19 නිර්මාණ පරාසය පුළුල් කිරීමට අංග රචනය කලා
තාක්ෂණය ප්‍රධාන සාධකයක්
ජයන්තා රණවක

21 මාධ්‍ය භාවිතය සහ මෙරට ළමා පරපුර
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කුමුදු කරුණාරත්න

24 ජන කවියක සංකල්ප රූප
අජන්ත විජේසේන

26 දැන්වීම්කරණයේ නිර්මාණශීලී භාවිතය
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය හංසමාලා රිටිගහපොළ


29 කැමරාකරණය සඳහා ප්‍රවේශයක්
ගිතේන්ද්‍ර අමරතුංග


32 හතරැස් රවුම් දින සටහන්
පුදිච

33 ගුවන්විදුලියට නව හැඳුනුම් පතක්
ආචාර්ය සේන නානායක්කාර

35 A/L සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
උදම් සතරසිංහ
















ළමා සිනමාව හඳුනා ගනිමු 37
නුවන් මද්දුම බණ්ඩාර


ගුවන්විදුලි මාධ්‍යයේ භාෂා භාවිතය 39
කුසුමචන්ද්‍ර අරංගල

ප්‍රචාරණය, ප්‍රචාරණ ව්‍යාපෘති, දැන්වීම්කරණය 42
ප්‍රියාන් ආර්. විජේබණ්ඩාර










44 නර්තනයේ සන්නිවේදනාත්මක භාවිතය
එන්. ජී. ශෂී නිරෝශනී

46 ලාංකේය වාර්තා සිනමාවේ තිඹිරිගෙය වූ රජයේ චිත්‍රපට අංශය
ශාස්ත්‍රපති හර්ෂ බී. අබේකෝන්

48 ප්‍රවෘත්ති වාර්තාකරණය
නදීක ජයනාත්

ජනහද, ජයදද නැංවූ ගිරුවාපත්තුවේ ශ්‍රී ලාංකේය අභිමානය
කවරයේ කතාව 50

බුදුරදුන් හා ධර්ම සන්නිවේදනය
දයා ශ්‍රී නරේන්ද්‍ර රාජපක්ෂ 67

O/L විභාගයට සූදානම් වන ඔබට
නාමලී රසිකා මාකලන්දාව 69

සිතීම දූප්පත් වීම
පරාක්‍රම ඒකනායක 72

නිසල කැමරාවෙන් කාලය නැවතීමේ ශිල්පය හා කලාව
ඡායාරූපකරණය
උපුල් ජයන්ත රණේපුර 74

ශ්‍රී ලංකේය මානව වංශලේඛ චිත්‍රපටය ''ලංකා ගීතය''
සුමින්ද කිත්සිරි ගුණරත්න 75

සිංහල පුවත්පත්වල ආරම්භය හා විකාශය
ප්‍රදීපා සංජීවනී දිසානායක 77

මානව සන්නිවේදනයේ පියසටහන්
නිශාන්ත පීරිස් 80

සරලව දැනගනිමු Marketing
සිසිල් එල්. බී. රත්නායක 81

සුලවේසි ගුහා චිත්‍ර
Sulawesi Cave Art 82

කාන්තාව පිළිබඳ මාධ්‍ය ආකල්ප
ජයන්තා රුක්මණී සිරිවර්ධන 83

A/L පුණරීක්ෂණ පාඩම් මාලාව
නිරෝෂ සංජීව 85

O/L සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
නාමලී රසිකා මාකලන්දාව 88

ලෝක සිනමාවේ අපූරු කෙටි චිත්‍රපටය 'Rain is Falling'
දිනේෂර පුංචිහේවා 90

රූපවාහිනී තාක්ෂණය
නාමල් සිල්වා 92

සෙයිසෝ හෙවත් සුපිරිසිදුකම
ප්‍රසන්න අධිකාරි 94


මෙහි පළවන ලිපිවල අන්තර්ගතය එම එක් එක් ලිපි සම්පාදනය කරනු ලබන ලේඛකයන්ගේ ස්වාධීන මතයයි. ප්‍රකාශන ආයතනයේ ප්‍රතිපත්තියක්, දර්ශනයක් හෝ මතයක් ඉන් පිළිබිඹු නොවේ.

# MEDIA TODAY

මාධ්‍ය ලෝකය ඔබ අතට

Volume 01 / 6th Issue / 2014

ISSN 2279-3402

**ජ්‍යෙෂ්ඨ සංස්කරණ උපදේශකත්වය**
කලාකීර්ති ආචාර්ය එඩ්වින් ආරියදාස

**සංස්කරණ උපදේශකත්ව මණ්ඩලය**
මහාචාර්ය විමල් දිසානායක
හවායි විශ්වවිද්‍යාලය
ඇමරිකා එක්සත් ජනපදය

මහාචාර්ය චන්ද්‍රසිරි රාජපක්ෂ
කැලණිය විශ්වවිද්‍යාලය

මහාචාර්ය රෝහණ ලක්ෂමන් පියදාස
කැලණිය විශ්වවිද්‍යාලය

මහාචාර්ය පැට්‍රික් රත්නායක
කැලණිය විශ්වවිද්‍යාලය

මහාචාර්ය අජන්තා හපුආරච්චි
කොළඹ විශ්වවිද්‍යාලය

ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

ආචාර්ය ටියුඩර් වීරසිංහ
ශ්‍රීපාලි මණ්ඩපය,
කොළඹ විශ්වවිද්‍යාලය

**සංස්කරණය**
දිනේෂර පුංචිහේවා

**සහාය සංස්කරණය**
දේවිකා මධුෂාණි

**සඟරා සැලසුම්කරණය**
මහාචාර්ය පැට්‍රික් රත්නායක

**කවර නිර්මාණය**
අයි. එම්. අමාන්

**නිශ්චල ඡායාරූපකරණය**
අයි. එම්. අමාන්

**පරිගණක මෙහෙයවීම, පිටු සැකසුම හා මාධ්‍ය රූප**
අයි. එම්. අමාන්
මිනොරු රත්නායක

**ශෝධ්‍යපත්‍ර පරීක්ෂාව**
කුසුමචන්ද්‍ර අරංගල

**යතුරු ලේඛනය**
ශසිකා නිරෝෂණී ගණේගොඩගේ

**ප්‍රධාන කළමනාකරු**
කුසුමචන්ද්‍ර අරංගල

**අලෙවිකරණය හා ප්‍රවර්ධනය**
කෞෂල්‍ය සමින්ද

# මාධ්‍ය හා සමාජ කාර්යය

15 වන ශතවර්ෂයේ දී ෂිප්ටන් මාතාව (Mother Shipton) නම් අනාගත වක්තෘවේදිනිය ලෝක විනාශය පිළිබඳ ව අපූරු මතයක් පළ කළාය. ඇයගේ අනාවැකියට අනුව මාළුන්ට මෙන් මිනිසුන්ට මුහුදේ දී ගමන් කළ හැකි වූ දාට, කුරුල්ලන් මෙන් අහසින් ගමන් කළ හැකි වූ දාට මෙන් ම පින්තූර සජීවී රූප මෙන් පෙනෙන දාට ලෝක විනාශය සිදුවන බවට මත පළ වූයේය. මෙහිදී මාළුන් මෙන් පිහිනා යන දාට මෙන් යැයි කීවේ සබ්මැරීන සොයා ගත් දාට ය. කුරුල්ලන් මෙන් අහසින් පියාඹා යන දාට යයි කීවේ ගුවන්යානා සොයා ගත් දාට ය. පින්තූර පණ ඇති මෙන් පෙනෙන දාට යැයි කීවේ සිනමාව හා රූප පෙට්ටිය සොයාගත් දාට ය. සබ්මැරීන මෙන් ම ගුවන්යානා ද මිනිසුන්ගේ විනාශය සඳහා සෘජුව ම යොදා ගන්නා අවස්ථා උදා වුව ද රූප පෙට්ටිය නිර්මාණය වූයේ හුදෙක් ම අධ්‍යාපනය, තොරතුරු හා විනෝදාස්වාදය මිනිසාට ළඟා කර දීම උදෙසා ය. එහෙත් බොහෝ සමාජ විද්‍යාඥයන් අද දවසේ දී රූපවාහිනිය යකාගේ පෙට්ටිය යැයි අර්ථනිරූපණය කරනුයේ ඉන් සිදුවන අනර්ථකාරී බලපෑම පිළිබඳ අධ්‍යයනය කිරීමෙන් පසුව ය. අද දවසේ දී මිනිසුන් පුද්ගලාන්තර සන්නිවේදනයේ යෙදෙන්නේ මිනිසුන් සමඟ නොව සැබවින් ම මාධ්‍ය හරහා ය. මිනිසුන් කන බොන දේ, අඳින පලඳින දේ, අහන දකින දේ මෙන් ම සමාජ ජීවිතයේ බොහෝ දේ තීරණය කරනු ලබන්නේ සාලයේ, නිදන කාමරයේ, කුස්සියේ හෝ නිවසේ කොතනක හෝ තැනක අරක් ගෙන සිටින යකාගේ පෙට්ටිය යි.

යකාගේ පෙට්ටිය හසුරුවනු ලබන්නේ යකාගේ පෙට්ටියට අරක් ගත් විවිධ සන්නම් නාම සහිත වෙළඳ ඒකාධිකාරයක් විසිනි. මේ තත්ත්වය යටතේ මිනිසුන්ගේ පරිකල්පන ශක්තිය මොට වී තිබේ. මිනිසුන්ගේ මානුෂික බැඳීම් ගිලිහී ගොස් තිබේ. ඒ පිළිබඳ අද දවසේ අහන දකින විවිධ ප්‍රවෘත්ති තුළින් ප්‍රත්‍යක්ෂ කරගත හැකි වෙයි. යකාගේ පෙට්ටියෙන් ඔබ්බට යමින් නව මාධ්‍ය, සමාජ මාධ්‍ය හරහා ද පුද්ගලයා සමාජය තුළ හුදකලා වෙමින් පුද්ගලයා සහ මාධ්‍ය, නව මාධ්‍ය, සමාජ මාධ්‍ය අතර අන්තර් සන්නිවේදන ක්‍රියාවලියක් සිදුවෙමින් අලුත් සමාජ ව්‍යසනයක් බිහිවෙමින් තිබෙ යි. නව මාධ්‍ය හා සමාජ මාධ්‍ය හරහා පුරවැසි ජනමාධ්‍යයේ යෙදෙන සමාජය ආචාරධර්ම හා මානුෂික බැඳීම් නොතකමින් සිද්ධි වාර්තාකරණයේ යෙදෙමින් සිටිනු ද අද දවසේ දී දැකගත හැකි තත්ත්වයකි. ජනමාධ්‍ය හැසිරවීමට ජනමාධ්‍යවේදය ඉගෙන ගත යුත්තේ ජනමාධ්‍ය හරහා සමාජයට යම් අනර්ථයක් කිරීමට නොව සමාජ ප්‍රගමනය උදෙසා මාධ්‍ය කාර්යයේ යෙදීම කළ යුතු නිසාවෙනි. එහෙයින් අද දවසේ දී මාධ්‍යවේදය යනු කුමක්ද? , මාධ්‍යවේදියාගේ කාර්යභාරය යනු කුමක්ද? පමණක් නොව මාධ්‍ය ඉදිරියේ සමාජය ක්‍රියාත්මක විය යුතු ආකාරය ද අධ්‍යයනය කළ යුතු ම අවස්ථාවක් බවට පත්ව තිබෙයි.

**Printing, Publication & Distribution**

**Creative Media Corporation (Pvt) Limited**
P.O. BOX : 114 Baththaramulla,
Tele : 0112 785878 / 0115 730555
Fax : 0115 730588
Email : creativemediacmc@gmail.com




## අපූර්ව සෞන්දර්යාත්මක අත්දැකීම

# 'රණවිරු රියල් ස්ටාර්'

ශ්‍රී ලංකාවේ සමාජ සංගීත කලා ක්ෂේත්‍රයන්හි එක් ප්‍රධාන වැඩසටහන් කොටසක් ලෙස රියල් ස්ටාර් (Real Star) මාධ්‍ය තුළින් මානව සමාජ ක්‍රියාවලියට මුසු වෙමින් පවතී. වර්තමානය වන විට ළමා වැඩසටහන්, තාරුණ්‍යය සඳහා වැඩසටහන් පමණක් නොව විවිධ වෘත්තික දිශානතීන් ඔස්සේ ද එය විහිද යයි. එහෙත් මෙයට අදාළ පාදකය ක්‍රි: පූ: යුග ගණන් දක්වා එනම් ග්‍රීක සහ පෙරදිග සමාජ කලා ක්‍රමවේදයෙහි තැන්පත් වන බව පැහැදිලි ය. එදා කලාවන් තුළ ජීවිතය සහ සමාජ ක්‍රියාවලිය විවරණයට ලක් වුවත් වර්තමාන Reality ක්‍රමවේදයෙන් ජන විඥානයට ආමන්ත්‍රණය කරන ස්වරූපයෙහි වෙනසක් දැකිය හැකි වේ. මෙහි වර්තමාන සෞන්දර්ය සහ ක්‍රමවේදී හැඩගැස්ම තුළින් ජීවිතය පිළිබඳ යථාර්ථයකට වඩා වින්දනාත්මක ස්වරූපයකට අදාළ සංයුතිය ගොඩනැගී තිබේ.

රූපවාහිනී මාධ්‍ය තුළින් ප්‍රචාරය වන රණවිරු රියල් ස්ටාර් වැඩසටහන සමාජ, සංගීත කලා මාධ්‍යයක් ලෙස ග්‍රාහකයා වෙත සිය නිශ්චිත පණිවුඩකරණය සඳහා එහි සම්ප්‍රදායන් සහ සංකේත ස්වරූප මුසුකොට ගත් සන්නිවේදන ක්‍රියාදාමයකට ඇතුළත් ජනප්‍රිය වැඩසටහනක් ලෙස දක්නට ලැබේ. මෙය ප්‍රාසාංගික කලා භාවිතයන් ශාස්ත්‍රීය නිපුණතා ස්ථාවරත්වයන් පදනම්කොට ගත්තකටත් වඩා හමුදා වෘත්තීයවේදී අනන්‍යතා මූලිකාංග වූ සංස්කෘතිකවේදී (Certain Orthodox Culture) බවකින් පොදුජන ග්‍රාහකත්වය තුළ ඔවුන් පිළිබඳ සිතීමට අවශ්‍ය නව මානයන් විවර කරවන්නක් බව ද පැහැදිලි ය. ඒ අනුව පැහැදිලි වන්නේ යුධ භටයා යනු ආයුධ, උණ්ඩ, වෛරය, සන්තාප, ඝාතන ආදී තත්ත්ව මූලිකව ගොඩනැගුණු, අනෙකුත් මානව සමාජ සංවේදීතාවන්ගෙන් වෙන් වූ කෙනකු නොවන සමූහයක් බව යි. එම සමාජ යථාර්ථය ප්‍රජානනය කොට ගෙන ඔවුන්ගේ ආයුධ, ඉලක්ක, වෙඩි උණ්ඩ පිටුපස වේදනාව, සංවේදීබව, කඳුළ, මානව ගුණ සහ සම්ප්‍රදායන් ප්‍රාසාංගික නිර්මාණාත්මක භාෂාවන් සහ ක්‍රියාවලීන්ගෙන් යුත් මානව සමාජ ක්‍රියාකාරිත්වයේ ම සංයුක්ත වූ ප්‍රබල කොටසක් ලෙස ගොඩනැගෙන සන්නිවේදනය අතිශය වැදගත් වේ. ඒ අනුව මේ ගොඩනැගෙන කලා මාධ්‍යය ම ඔවුන්ගේ ආධ්‍යාත්මික සමාජ සහ වෘත්තීය යථාර්ථය පිළිබඳ

ස්වරූප නිර්මාණාත්මක ව ග්‍රාහක මනස තුළ වර්ධනය කිරීමට ඉවහල් වන බැව් පෙනේ.

සංගීතය යනු කලාත්මක ලෙසින් සහ සෞන්දර්යාත්මක ලෙසින් ජන විඥානයට ආමන්ත්‍රණය කළ හැකි ප්‍රබල වින්දන මාධ්‍යයකි. එය තොරතුරු සමාජගත කිරීමට හැකි ප්‍රබල මෙවලමකි. එහි සංගීතමය ගුණය පමණක් නොව එය සාහිත්‍ය කලාවක් ලෙසින් ද විඳිය හැකි වේ. මෙහි ඇති ප්‍රචාරාත්මක කෘත්‍යය සහ එහි විලාසිතාව සමාජ පරිවර්තන ගුණයෙන් යුක්ත ය. සෞන්දර්යාත්මක කලා මාධ්‍යයන් යම් රටක සමාජ, ආර්ථික, සංස්කෘතික ස්වරූපයන් තුළින් ගොඩනැගෙන්නාක් මෙන්ම කලා මාධ්‍යයෝ ද සමාජ සංස්කෘතික වටපිටාව පිළිබඳ ලේඛනයක් බවට පත්වෙති. එම ලේඛන පරිශීලනය තුළ රටක සමාජයෙහි මනස පිළිබඳ සහ ඔවුන්ගේ වින්දනය පිළිබඳ සම්ප්‍රදායේ ස්වරූප කියවිය හැකි වේ. වින්දනය මනෝ මූලික න්‍යායන්ගේ සීමාවලින් ඉවත් කළ හැක්කක් ද නොවේ. එකම කලා සෞන්දර්ය නිර්මාණ පිළිබඳ වුව ප්‍රේක්ෂක ප්‍රජාව විසින් අන්තර් සංවේදීභාවයක් ගොඩනංවා ගනු ලබන්නේ ඒකීය ලෙසට නොවේ. සමාජ සංස්කෘතියේ ආධ්‍යාත්මික සහ දෘෂ්ටි වර්ධනය සඳහා මෙම සංගීත සහ කලා සෞන්දර්යන් ප්‍රබල මෙහෙයක් සිදු කළත් ඒ පිළිබඳ පූර්ණ චිත්‍රයක් හෝ ප්‍රබල විචාරයක් ප්‍රේක්ෂක ප්‍රජාවට නොමැති වීමේ ගැටලුව පොදු නියමයකි. එහෙත් සෞන්දර්ය, කලාව සහ පුද්ගල සංවේදනයන්ගේ අන්තර් සම්බන්ධතාවය පිළිබඳ සම්ප්‍රදායන් හි ස්වරූප විමසීමේදී එය දිගු මානව ඉතිහාසයක සිට විවිධ සමාජ සංරචකයන් සමඟ අවිඥානික හෝ සවිඥානික ලෙස ව්‍යුහගත වී ඇති බැව් පැහැදිලි ය.

**ආචාර්ය ධර්මකීර්ති ශ්‍රී රන්ජන්**
**ශ්‍රීපාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය**

ශ්‍රී ලාංකේය සමාජයේ එක් පරම්පරාවකටත් වඩා ඔවුනගේ තාරුණ්‍යය, බුද්ධිය, අවිය සහ සමාජ ශක්තීන් යුධ පසුබිමක් තුළ කැප කිරීමට සිදුවූයේ සමාජ, ආර්ථික, ආධ්‍යාත්මික සහ නිෂ්පාදන ක්‍රියාවලියට ද බරපතල අර්බුදයක් නිර්මාණය කරමිනි. යුද්ධය සමාජ සම්ප්‍රදායක් බවට පත්වෙමින් සහජීවනය කේන්ද්‍රීය වූ අප සමාජ පරිසරයෙහි අන්‍යෝන්‍ය සහසබඳතාවය සහ සහජීවනය මරා දැමීමේ ක්‍රියාවලිය පොදු භාෂාවක් බවට පත්විය. එම ගැටලුව සමස්ත සමාජ ක්‍රියාවලියේ පමණක් නොව සමාජ ව්‍යුහීය ස්වරූපය දක්වා විසරණය වී තිබූ අයුරු පැහැදිලි ය. සමස්ත සමාජ දේහයේ වූ ප්‍රබල කම්පන ක්‍රියාවලිය ශ්‍රී ලාංකේය පශ්චාත් යුධ අවධියේ දී පවා ප්‍රබලව දැනේ. මෙම යුධ මනෝභාවයන් සහ එම සමාජ පරිසරය සහ පුද්ගල ක්‍රියාකාරිත්වය ශ්‍රී ලාංකේය සමාජ සංස්කෘතික ලේඛනයෙන්, ජාතිවාදී ලේඛනයෙන් සහ මානව සමාජ කේන්ද්‍රීය චින්තනයෙන් (Ethnocentrism) යම් ප්‍රමාණයකට හෝ ඉවත් කිරීමේ උත්සාහයට මූලික වන්නේ හමුදා ක්‍රියාකාරී කැප කිරීම ය. ජාතීන් සහ සංස්කෘතීන් අතර යම් ආකාර වූ සහනශීලීත්වයක්, සංහිඳියාවක්, සහජීවනයක් සහ දේශපාලන ක්‍රමවේදාත්මක විසඳුමක් දශක ගණනාවක සිට ශ්‍රී ලාංකේය ප්‍රජාව සොයමින් සිටී. මේ පිළිබඳ කලාත්මක සෞන්දර්යාත්මක චින්තනයකින් සහ විඥානයකින් තොරව දිගු කාලීන පදනමක් ගොඩනැගිය හැකි ද යනු ගැටලුවකි. එතරම් ම කලාව සහ සෞන්දර්ය පිළිබඳ මානව විඥානය ප්‍රබල ය. එය අවදි කිරීම අත්‍යවශ්‍ය සමාජ කාර්යයකි.



නව සමාජ ආර්ථික, සංස්කෘතික, ආධ්‍යාත්මික සහ දෘෂ්ටිවාදී තත්ත්ව හැඩගැස්වීමෙහිලා කලා සෞන්දර්යයට කළ හැකි මෙහෙය ප්‍රබල වන අතර එය ප්‍රබුද්ධ ප්‍රජා ක්‍රියාකාරිත්වයේ ද ප්‍රතිඵලයකි. පොදු සමාජය යන අදහස මුලින් ම ගොඩනැගෙන්නේ දෘෂ්ටිය තුළ යි. මෙයට අදාළ දැවැන්ත මානව සම්පතක් නිර්මාණය කිරීමේ හැකියාව කලා සෞන්දර්ය සතුව පවතී. මානව සංහතියේ ප්‍රගතියට අදාළ ප්‍රතිවිරෝධතා පාලනය කිරීමකටත් වඩා ඒ පිළිබඳ ගැඹුරු විඥානයක් නිර්මාණය කර ගැනීමට අවශ්‍ය ප්‍රබුද්ධත්වය කලාව තුළින් ගොඩනැංවිය යුතු ය. සෞන්දර්ය කර්මාන්තයේ ප්‍රබල වගකීම වන්නේ සමාජ පාලනය සිදුවීමට අවශ්‍ය ක්‍රමවේදයන් සහ ආධ්‍යාත්මික ස්වරූපයන් ගොඩනැංවීම යි. කලාවෙහි සහ ප්‍රාසාංගික බවෙහි ගෝලීය සහ ජාතික අත්දැකීම් මූලික කර ගනිමින් එහි සීමාවන් සහ ගැටලු ශ්‍රී ලාංකේය සමාජ දේහය තුළ නිර්මාණය කර ගෙන ඇත. මෙම ගැටලුව සෞන්දර්ය සහ ප්‍රාසාංගිකත්වය පිළිබඳ පොදු රසඥතාවයෙහි ගැටලුවකි. ඒ අනුව තාක්ෂණික සහ සමාජ ප්‍රවණතා, සමාජ ගතික මූලික වූ ගෝලීය අභියෝග වලට මුහුණ දෙන සමකාලීන සමාජයෙහි සෞන්දර්ය පිළිබඳ පොදු රසඥතාවක් නිර්මාණය නොවී තිබීම ද ක්ෂේත්‍රය මුහුණපාන ප්‍රබල ගැටලුවකි. ඒ සඳහා අවකාශය සැලසීමේ අභියෝගය පිළිබඳ සිතිය යුතු වේ.